## මධ්‍යම පළාත් කෙටි චිත්‍රපට උළෙල -2024

**මධ්‍යම පළාතේ කලා නිර්මාණ හැකියාවන් ඇති කලාකරුවන්ට සිනමා මාධ්‍ය තුල හැකියාවන් ඉස්මතු කර ගැනිමටත් ඒවා එළිදැක්වීමට හා ඇගයීමට අවස්ථාව සලසමින් නිර්මාණ කුසලතාවන ඔප නංවා ජාතික හා ජගත් මට්ටමට ගෙන යාහැකි අවස්ථාවන් උදා කිරිම අරමුණු කර ගනිමින් 2015 වර්ෂයේ සිට අප දෙපාර්තමේන්තුව මගින් ආරම්භ කර පවත්වාගෙන යනු ලැබූ මධ්‍යම පළාත් කෙටි චිත්‍රපට උළෙල පසුගිය වර්ෂවලදී රටේ පැවති ආර්ථික අර්බුද හමුවේ පැවැත්වීමට නොහැකි විය. නමුත් මෙම වසරේ සිට දෙපාර්තමේන්තු කාර්යභාරයන් නැවත පෙර පරිදි පවත්වාගෙන යාමට හැකිවේයැයි අපේක්ෂා කෙරෙන අතර මධ්‍යම පළාත් කෙටි චිත්‍රපට උළෙල පහත සඳහන් පරිදි පැවැත්වීමට අදහස් කර තිබේ.**

**අරමුණ**

ප්‍රබල ප්‍රකාශන මාධ්‍යයක් තුල මධ්‍යම පළාතේ කලාකරුවන්ගේ නිර්මාණ හැකියාවන් ජාතික හා ජගත් මට්ටමට ගෙන යාම

**ද්විතියික අරමුණු**

- වාර්තා චිත්‍රපට තුලින් අස්පර්ශීය සංස්කෘතික උරුමයන් පිලිබඳ තොරතුරු සුරක්ෂිත කිරීම
- යහපත් ආකල්ප සමාජගත කිරීම
- මධ්‍යම පළාත තුල ජාතික මට්ටමේ සිනමාකරුවන් බිහි කිරීම

**පවත්වන ක්‍රමවේදය**

- අයදුම්පත් කැඳවීම
- පුහුණු වැඩමුළුවක් පැවැත්වීම
- තිරපිටපත් සහ චිත්‍රපට නිර්මාණ ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් මගින් විනිශ්චය කිරීම.
- හොඳම නිර්මාණ සඳහා ත්‍යාග , සහතික හා සම්මාන ප්‍රදානය

**තරග කොන්දේසි**

1. . තරගය කාණ්ඩ දෙකකින් සහ පාසල් හා විවෘත යන අංශ දෙකකින් පැවැත්වේ
2. 1.1. වාර්තා චිත්‍රපට ( පාසල් සහ විවාත අංශය)
   1.2. වෘත්තාන්ත චිත්‍රපට ( පාසල් සහ විවාත අංශය)
3. පාසල් අංශය සඳහා මධ්‍යම පළාතේ පාසල්තුල ඉගෙනුම ලබන දරු දැරියන්ට සහභාගි විය හැකි අතර එම පාසලේ ඉගෙනුම ලබන බවට අයදුම්පතෙහි විදුහල්පති විසින් සනාථ කර තිබිය යුතුය
4. මෙම තරගය සඳහා ඕනෑම කැමරාවක් භාවිතා කල හැකිය. කෙසේ වුවද රූපරාමු පැහැදිලිව තිබිය යුතු අතර විනිශ්චයේදී, ඔබ භාවිත කරන ලද උපාංගයේ තත්ත්වය නොසලකා විනිශ්චය කටයුතු සිදු කිරිමට තිරණය කර ඇත.
5. තරගය සඳහා සංස්කෘතික දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු අයවලුන් හැර මධ්‍යම පළාතේ පදිංචි අයෙකුට ඉදිරිපත් විය හැකිය.
6. තිර පිටපත එවීමට පෙර අයදුම්පත එවිය යුතුය.
7. අයදුම්පත් එවූ අයට පුහුණු වැඩමුළුවක් පැවැත්වීමට අපේක්ෂා කරන අතර පුහුණු වැඩමුළුවෙන් ලබා ගත් දැනුමද උපයෝගි කර ගනිමින් චිත්‍රපටය ඩීවීඩී පට දෙකකින් ඔබගේ නිර්මාණය අප වෙත එවිය යුතුය. ඒ සමග
   - තිරපිටපත
   - සාරාංශ සටහන
   - චරිත අපේක්ෂාවන් හා චරිත ස්භාවයන්
   - කතාවේ දෘෂ්ටිය යන සටහන් පිටපත් දෙක බැගින් එවිය යුතුය

8. නිර්මාණයේ කාලය විනාඩි 03 – 15 අතර විය යුතුය
9. එක් අයෙකුට වාර්තා හා වෘත්තාන්ත වශයෙන් නිර්මාණ 02 ක් එවිය හැකිය.
10. එවනු ලබන නිර්මාණය රජයේ අනුග්‍රහයෙන් පවත්වන ලද තරගයක ජයග්‍රහණය ලැබූ නිර්මාණයක් නොවිය යුතුය
11. වෘත්තාන්ත කෙටි චිත්‍රපටයට තමන් කැමති තේමාවක් යොදා ගත හැකිය
12. වාර්තාමය කෙටි චිත්‍රපටය සඳහා මධ්‍යම පලාතේ සංස්කෘතික, පාරිසරික හෝ සාමාජීය වැදගත්කමක් ඇති තේමාවක් යොදාගත යුතුය
13. තම නිර්මාණය තුල කිසියම් දේශපාලන පක්ෂයක්, ආගමක් ,ආයතනයක් හෝ පුද්ගලයෙක් ඍජුව විවේචනයට ලක් නොවිය යුතුය.
14. මත්ද්‍රව්‍ය භාවිතය , ඍජු ලිංගික දර්ශන හෝ අසැබි දර්ශන ඇතුලත් නොවිය යුතුය
15. අයදුම්පත්‍රය 2024.05.01 දිනට පෙර එවිය යුතු අතර තිරපිටපත හා ඩීවීඩී පටය 2024.05. 30 දිනට ප්‍රථම අප වෙත එවිය යුතුය. අයදුම්පත අනුව පුහුණු වැඩමුළුවට කැඳවනු ලබන අතර වැඩමුළුවෙන් පසුව චිත්‍රපටය නිර්මාණය ආරම්භ කිරීමට අවස්ථාව ඇත
16. විනිශ්චය මණ්ඩලයේ තීරණය පළාත් අධ්‍යක්ෂ වරයා අනුමත කිරීමෙන් පසු එය අවසන් තීරණය සේ සළකණු ලැබේ.
17. ජයග්‍රහණ නිර්මාණ වලින් දරුවන් සඳහාද වඩාත් සුදුසු නිර්මාණයන් සම්මාන උළෙලට සමගාමීව තිරගත කිරීමට බලාපොරොත්තු වන අතර පහත සඳහන් පරිදි පාසල් අංශ හා විවෘත අංශ සඳහා වෙන වෙනම සම්මාන,සහතික හා ත්‍යාග පිරිනැමීමට බලාපොරොත්තු වේ.
    i. **වසරේ හොඳම වාර්තා චිත්‍රපට නිශ්පාදනය**
    ii. **වසරේ හොඳම වෘත්තාන්ත චිත්‍රපට නිශ්පාදනය**
    iii. **වසරේ හොඳම වෘත්තාන්ත චිත්‍රපට අධ්‍යක්ෂණය**
    iv. **වසරේ හොඳම වාර්තා චිත්‍රපට අධ්‍යක්ෂණය**
    v. **වසරේ හොඳම තිරපිටපත**
    vi. **වසරේ හොඳම සාමාජීය මැදිහත්වීම**
    vii. **හොඳම නිළිය**
    viii. **හොඳම නළුවා**
    ix. **හොඳම සහය නිළිය**
    x. **හොඳම සහය නළුවා**
    xi. **හොඳම කලා අධ්‍යක්ෂණය**
    xii. **හොඳම කැමරාකරණය**

18. මෙම තරග සඳහා එවනු ලැබූ චිත්‍රපට සම්බන්ධව කවරෙකු හෝ විරෝධයක් පාන්නේනම් එකී නිර්මාණය පිළිබඳව සම්මාන ලබා දීමට අවම වශයෙන් දෙසතියකට පෙරවත් තම අයිතිවාසිකම් හෝ විරෝධය මධ්‍යම පළාත් සංස්කෘතික අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කල යුතුය. ඉන් පසුව කෙරෙන විරෝධතා සලකාබලනු නොලැබේ.
19. අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව තරගය සම්බන්ධයෙන් තීරණාත්මක අයිතිය සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂවරයා සතු වේ.

ටී එම් ඉනෝදනී තඹවිට
පළාත් අධ්‍යක්ෂ,
මධයම පළාත් සංස්කෘතික කටයුතු
දෙපාර්තමේන්තුව
මධ්‍යම පළාත.

**මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**
**කෙටි චිත්‍රපට තරග අයදුම්පත්‍රය - 2024**

1. කෙටි චිත්‍රපටයේ නම ..............................
2. වාර්තාද වෘත්තාන්තද යන්න ..............................
3. අධ්‍යක්ෂවරයාගේ නම ..............................
4. ජාතික හැඳුනුම්පත් අංකය ..............................
5. ලිපිනය ..............................
..............................
6. දුරකතන අංකය- නිවස .............................. ජංගම ..............................
7. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ..............................
8. මා විසින් ඉල්ලුම්පත්‍රයේ සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරන අතර මාගේ කෙටි චිත්‍රපටය ( වාර්තා/ වෘත්තාන්ත) ජයග්‍රහනය කරනු ලැබුවහොත් ඒය අවශ්‍ය පරිදි ප්‍රදර්ශනය කිරීමට ඒකගතාවය ප්‍රකාශ කරමි.

    තවද මා විසින් මෙහි ප්‍රකාශිත කරුණු අසත්‍ය බැව් ඔප්පු වුවහොත් හෝ ව්‍යවස්ථාවේ සඳහන් කරුණු වලට පටහැනිව ක්‍රියාකර ඇත්තේනම් මධ්‍යම පළාත් කෙටිචිත්‍රපට තරගයේ කුමන අවස්ථාවකදී වුවද මාගේ නිර්මාණය තරගයෙන් ඉවත් කිරීමට හෝ සම්මාන සඳහා නොසලකා හැරීමට මධ්‍යම පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුවට අයිතිය ඇති බව ප්‍රකාශ කර සිටිමි.

..............................    ..............................

දිනය    අත්සන

---

**(පාසල් අයදුම්කරුවන් සඳහා පමණි)**

ඉහත අයදුම් පත්‍රයේ ..............................ලෙස නම් සඳහන් කෙටි චිත්‍රපටය

මෙම පාසලේ ..............................ශ්‍රේණියේ ඉගෙනුම ලබන ..............................

..............................ශිෂ්‍යා / ශිෂ්‍යාව මෙම චිත්‍රපටය

අධ්‍යක්ෂණය කල බව මෙයින් සහතික කරමි.

..............................    ..............................

දිනය    අත්සන
විදුහල්පතිගේ නිල මුද්‍රාව

---

**(විවෘත අංශයේ අයදුම්කරුවන් සඳහා පමණි)**

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත් මෙම අයදුම්කරු ..............................

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ .............................. ග්‍රාමනිලධාරි වසමේ ස්ථිර පදිංචි අයෙකු බවත් සහතික කරමි.

..............................

සංස්කෘතික නිලධාරි නිලමුද්‍රාව